# පාස්කු සතියේ
# අඟහරුවාදා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොතෙන් ගත් පාඨයෙකි ක්‍රියා 2 : 36–41

**ඔබ මනස්ථාපනය වී ජේසුස් වහන්සේගේ නාමයෙන් ස්නාපනය ලබන්න.**

"ඔබ කුරුසියෙහි ඇණ ගැසූ මේ ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේ විසින් ස්වාමින් බවටත්, ක්‍රිස්තුස් බවටත් පත් කර වදාළ බව මුළු ඉශ්රායෙල් ජනතාව සහතික ලෙස දැනගනිත්වා"

ජනතාව ඒ අසා සන්තාපිත සිත් ඇතිව "සහෝදරවරුනි, අප කුමක් කළ යුතුදැ"යි පේදුරුගෙන් ද අනෙක් අපෝස්තුළුවරුන්ගෙන් ද විචාළහ. පේදුරු තුමා පිළිතුරු දෙමින් "ඔබ සියලු දෙනාම මනස්ථාපනය වී පව් කමාව ලබන පිණිස ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් බෞතීස්ම ස්නාපනය ලබන්න. එවිට ඔබ ශුද්ධාත්ම දීමනාව ලබන්නහු ය. මන්ද ඒ පොරොන්දුව ඔබටත්, ඔබගේ දරුවන්ටත්, දුර බැහැර වෙසෙන අන් අයටත් සැබැවින්ම අපගේ ස්වාමින් වන දෙවියන් වහන්සේ විසින් කැඳවනු ලබන සියල්ලන්ටත් ය"යි කීය. ඔහු තවත් බොහෝ වචනවලින් උදක්ම අයදිමින් "මේ කුහක පරම්පරාවෙන් ගැළවෙන්නැ"යි ඔවුන්ට අනුශාසනා කළේය. එවිට ඔහුගේ වචනය පිළිගත් අය බෞතීස්ම ස්නාපනය කරනු ලැබූහ. ඒ දවසේ දී තුන් දාහක් පමණ පුද්ගලයෝ ඔවුන්ගේ සංඛ්‍යාවට එකතු කරන ලදහ.

දේව වාක්‍යය එසේය.

# පිළිතුරු ගීය

ගීතාවලිය **33 : 4-5, 18-20, 22**

පිළිතුර: මහ පොළොව හිමි තුමන්ගේ කරුණාවෙන් පිරී ඇත. ආලේලූයා //

ගීය:

සමිඳුන්ගේ වචනය අවංක ය. එතුමන්ගේ ක්‍රියා සියල්ලක්ම විශ්වාසශීලී ය. දැහැමි බව හා යුක්තිය එතුමන්ට ප්‍රිය ය. මහ පොළොව හිමි තුමන්ගේ කරුණාවෙන් පිරී ඇත.

දේව භය ඇත්තෙති, දේව කරුණාව පතන්න. මරණයෙන් ගලවන පිණිස ද දුබික් දුරු කොට දිවි රක්නා පිණිස ද එතුමාණෝ දිවැසින් බලන සේක.

අපි හිමිතුමන් කෙරේ විශ්වාසයෙන් බලා සිටියෙමු. අපේ පිහිටත් පලිහත් එතුමාණෝ ය. සමිඳුනි, ඔබ අප කෙරේ බලාපොරොත්තු පිහිටෙවු ලෙස ම ඔබේ කරුණාව අප කෙරෙහි වේවා!

# සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
මෙන්න සමිඳුන්ගේ ජය මංගල දිනය! මෙදින අපි ප්‍රීති වෙමු. සන්තෝෂ වෙමු.
ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 20 : 11-18

**"මම ස්වාමින් වහන්සේ දුටිමි. උන් වහන්සේ මා සමඟ කතා කළ සේක.**

ශ්‍රාවකයෝ හැරී ගිය නමුත් මරියා සොහොන් ගෙය ළඟ පිටත හඬමින් සිටියාය. ඇය මෙසේ හඬමින් ම සොහොන් ගෙය ඇතුළට නැමී බැලුවා ය. එවිට ජේසුස් වහන්සේගේ සිරුර තබා තිබූ ස්ථානයෙහි සුදු වස්ත්‍ර හැඳගත් දේව දූතයන් දෙදෙනෙකු එක් තැනැත්තෙක් හිස තැබූ තැන ද අනෙකා පාද අද්දර ද හිඳුනු දුටුවා ය. එකල ඔව්හු "ස්ත්‍රිය, ඔබ හඬන්නේ මන්දැ"යි ඇගෙන් ඇසූහ. "ඔවුන් මාගේ ස්වාමින් වහන්සේ ගෙන ගොස් කොතැන තැන්පත් කර ඇද්දැයි මා නොදන්නා නිසා ය" යි ඈ පිළිතුරු දුන්නාය. මෙසේ කියමින් ඈ ආපසු හැරෙද්දී ජේසුස් වහන්සේ එහි සිටින බව දුටුවාය. එහෙත් ඒ ජේසුස් වහන්සේ බව ඈ නොදත්තිය. "ස්ත්‍රිය ඔබ හඬන්නේ මන්ද? ඔබ කවරෙකු සොයන්නෙහි දැ"යි ජේසුස් වහන්සේ ඇගෙන් ඇසූ සේක. ඈ උන් වහන්සේ උයන් ගොව්වා යයි සිතා "මහතාණෙනි, ඔබ උන් වහන්සේ ගෙන ගියා නම් උන් වහනසේ කොතැන තැන්පත් කළෙහි දැ යි මට කිව මැනව. මම උන් වහන්සේ රැගෙන යමි"යි කීවාය. ජේසුස් වහන්සේ "මරියා" කියා ඈ ඇමතූ සේක. ඈ ද හැරී "රබ්බෝනි" යි හෙබ්‍රෙව් බසින් උන් වහන්සේට පිළිවදන් දුන්නාය. එහි අර්ථය "ගුරු දේවයිනි" යනුයි.

ජේසුස් වහන්සේ කතා කොට "මා අල්ලන්ට එපා, මන්ද, මම තවම පියාණන් වහන්සේ වෙතට නොනැංගෙමි. ඒ නිසා දැන් ඔබ මාගේ සහෝදරයන් වෙතට ගොස් 'මම, මාගේ පියාණන් වහන්සේ හා ඔබගේ පියාණන් වහන්සේ ද මාගේ දෙවියන් වහන්සේ හා ඔබගේ දෙවියන් වහන්සේ වෙතට නගින්නෙමි' යි ඔවුන්ට කියන්නැ"යි වදාළ සේක.

මග්දලායේ මරියා ශ්‍රාවකයන් වෙතට ගොස් "මම ජේසුස් වහන්සේ දිටිමි" යි කියා ද, මේ දේවල් උන් වහන්සේ ඇට වදාළ බව ද ඔවුන්ට දැන්වූවා ය.